ඇබෑර්තු

ශ්‍රී ලංකා සංචාරක හා හෝටල් කළමනාකරණ ආයතනය

ශ්‍රී ලාංකේය සත්කාරක සේවා පුහුණුවේ විශිෂ්ටයන් හා එක්වීමට ඔබට ආරාධනා

01. ලේඛකාධිකාරී - (HM 1-1 කාණ්ඩය) - කොළඹ

සුදුසුකම්:

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව පිළිගත්, පරිපාලන, කළමනාකරණය, සංචාරක ව්‍යාපාරය, අධ්‍යාපනය හා සබැඳි සමාජ විද්‍යාව පිළිබඳ ප්‍රථම උපාධියක්

-සමග-

පරිපාලනය, කළමනාකරණය, සංචාරක ව්‍යාපාරය, අධ්‍යාපනය, හා සබැඳි සමාජ විද්‍යාව පිළිබඳ පශ්චාත් උපාධියක් (දර්ශනපති)

-සහ-

සංස්ථාවක, ව්‍යවස්ථාපිත මණ්ඩලයක / ආයතනයක හෝ පිළිගත් පෞද්ගලික ආයතනයක හෝ අධ්‍යාපනික ආයතනයක 'කළමනාකරණ මට්ටමේ' අවම වශයෙන් වසර 15ක පළපුරුද්ද.

වැටුප් පරිමාණය :

HM 1-1 – 2016 රු. [80,295 – 15 x 2,270 – 114,345/-]

කළමනාකරණ සේවා දෙපාර්තමේන්තු චක්‍රලේඛ අංක 02/2016 පරිදි ජීවන වියදම් දීමනාව සහ රජයේ අනුමත අනෙකුත් දීමනා ද ගෙවනු ලැබේ. ඊට අමතරව, වාහන දීමනාව මෙන්ම ඉන්ධන හා වෘත්තීය දීමනා මාසිකව ගෙවනු ලැබේ. දීමනා සමග දළ වැටුප මාසිකව රු. 150,000/- ඉක්මවනු ලැබේ.

වයස :

වයස අවුරුදු 35 ට නොඅඩු විය යුතු අතර, අවුරුදු 55 ට නොවැඩි විය යුතුය. උපරිම වයස් සීමාව අභ්‍යන්තර අයදුම්කරුවන්ට අදාළ නොවේ.

02. ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය (AR - 2 කාණ්ඩය)

අධ්‍යයන අංශය	තනතුරු	පාසල
වෘත්තීය සූප වේදය (Professional Cookery)	03	කොළඹ/ මහනුවර/ කොග්ගල
පේස්ට්‍රි හා බේකරි (Pastry & Bakery)	01	කොළඹ
ආහාර හා පාන කළමනාකරණය (Food & Beverage)	01	කොළඹ (පුහුණු හෝටලයක/ ආපනශාලාවක / ගෝජනාගාරයක කළමනාකරණය මෙහෙයවීමේ හැකියාව අයදුම්කරුට තිබිය යුතුය.)
පර්යේෂණ හා තත්ත්ව සහතික කිරීම (Research & Quality Assurance)	01	කොළඹ

සුදුසුකම් (පහත 1 හෝ 2 හෝ 3):

1. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව පිළිගත්, සංචාරක ව්‍යාපාරය සහ ආගන්තුක සත්කාර කළමනාකරණය පිළිබඳ විශේෂ උපාධියක්/ භාෂා උපාධියක් (ඉංග්‍රීසි භාෂාව පිළිබඳ විශේෂ)

   සමග

   සංචාරක ව්‍යාපාරය සහ ආගන්තුක සත්කාර කළමනාකරණය පිළිබඳ දර්ශනවේදී උපාධියක් (Masters Degree)

   සහ

   පළමු උපාධිය ලබා ගැනීමෙන් පසු, අධ්‍යාපනික ආයතනයක හෝ තරු තුන හෝ ඉහළ වර්ගීකරණය සහිත හෝටලයක අවම වශයෙන් වසර 08 ක පළපුරුද්ද, රජයේ සංස්ථාවක, මණ්ඩලයක, ව්‍යවස්ථාපිත ආයතනයක විධායක මට්ටමේ පළපුරුද්ද.

2. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව පිළිගත් සංචාරක ව්‍යාපාරය සහ ආගන්තුක සත්කාර කළමනාකරණය / භාෂා උපාධිය (ඉංග්‍රීසි භාෂාව පිළිබඳ විශේෂ) සමග අදාළ ක්ෂේත්‍රයේ ආචාර්ය (PhD) උපාධියක්

   සහ

   උපාධිය ලබා ගැනීමෙන් පසු, අධ්‍යාපනික ආයතනයක හෝ තරු තුන හෝ ඉහළ වර්ගීකරණය සහිත හෝටලයක අවම වශයෙන් වසර 05 ක පළපුරුද්ද, රජයේ සංස්ථාවක, මණ්ඩලයක, ව්‍යවස්ථාපිත ආයතනයක විධායක මට්ටමේ පළපුරුද්ද.

3. ශ්‍රී ලංකා සංචාරක හා හෝටල් කළමනාකරණ ආයතනයේ (SLITHM) වෘත්තීය සූප වේදය / ආහාර හා පාන කළමනාකරණය හෝ අදාළ ක්ෂේත්‍රයේ විශේෂඥතාව සමග සංචාරක ව්‍යාපාරය / ආගන්තුක සත්කාර කළමනාකරණය පිළිබඳ පශ්චාත් උපාධි (දර්ශනපති) සුදුසුකම් තිබීම.

   සහ

   ඉගැන්වීම සහ / හෝ පුහුණු කිරීමේ හා මානව සම්පත් සංවර්ධන ක්‍රියාකාරකම්හි සෘජුව නියැලීමේ අවම වසර 05 ක පළපුරුද්ද ඇතුළුව ආගන්තුක සත්කාර ක්ෂේත්‍රය පිළිබඳ කළමනාකරණ මට්ටමේ අවම වශයෙන් වසර 12 ක පළපුරුද්ද

වැටුප් පරිමාණය :

AR 2 - 2016 රු. (76,200 - 10 x 2,000 - 96,200)

කළමනාකරණ සේවා දෙපාර්තමේන්තු චක්‍රලේඛ අංක 02/2016 පරිදි ජීවන වියදම් දීමනාව සහ අනෙකුත් රජයේ අනුමත දීමනා ද ගෙවනු ලැබේ. ඊට අමතරව මාසික වෘත්තීය දීමනාවක් සහ දුරකථන දීමනාවක් ද ගෙවනු ලැබේ. රජයේ නීතිරීති හා රෙගුලාසි අනුව ප්‍රවාහන පහසුකම් සපයනු ලැබේ.

පුහුණු හැකියාවන් මත පදනම්ව අතිරේක අදායම් අවස්ථා ලබා දෙනු ඇත.

වාර්ෂිකව තරු හතරේ/පහේ හෝටල්වල නේවාසික පුහුණුව ලැබීමේ අවස්ථාව ලබා දෙනු ඇත.

වයස :

වයස අවුරුදු 30 ට නොඅඩු විය යුතු අතර, අවුරුදු 55ට නොවැඩි විය යුතුය. අභ්‍යන්තර අයදුම්කරුවන්ට උපරිම වයස් සීමාව අදාළ නොවේ.

03. කථිකාචාර්ය / සහකාර කථිකාචාර්ය (AR – 1 කාණ්ඩය)

අධ්‍යයන අංශය	තනතුරු	පාසල
වෘත්තීය සූප වේදය (Professional Cookery)	03	කොළඹ/ අනුරාධපුර/ යාපනය
ආහාර හා පාන කළමනාකරණය (Food & Beverage)	04	අනුරාධපුර/ මඩකලපුව/ බණ්ඩාරවෙල/ මහනුවර
ගෘහ පාලනය (Housekeeping)	03	රත්නපුර/ කොළඹ/ අනුරාධපුර
අමුත්තන් පිළිගැනීමේ අංශය (Front Office)	02	මහනුවර/ රත්නපුර

සුදුසුකම් (පහත 1 හෝ 2 හෝ 3) :

1. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව පිළිගත්, සංචාරක ව්‍යාපාරය සහ ආගන්තුක සත්කාර කළමනාකරණය පිළිබඳ විශේෂ උපාධියක්/ භාෂා උපාධියක් (ඉංග්‍රීසි භාෂාව පිළිබඳ විශේෂ)
2. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව පිළිගත් සංචාරක ව්‍යාපාරය සහ ආගන්තුක සත්කාර කළමනාකරණය පිළිබඳ සාමාන්‍ය උපාධියක්/ භාෂා උපාධියක් (ඉංග්‍රීසි භාෂාව පිළිබඳ විශේෂ) සමග අදාළ ක්ෂේත්‍රයේ පශ්චාත් උපාධි ඩිප්ලෝමාවක්
3. ශ්‍රී ලංකා සංචාරක හා හෝටල් කළමනාකරණ ආයතනයේ (SLITHM) වෘත්තීය සූප වේදය/ ආහාර හා පාන කළමනාකරණය/ අමුත්තන් පිළිගැනීමේ අංශය/ හෝටල් ගෘහපාලනය පිළිබඳ විශේෂඥතාව සමග පූර්ණ උපාධිධාරියකු වීම.

   -සහ-

   තරුතුනේ හෝ ඉහළ වර්ගීකරණය ලද හෝටලයක විධායක ශ්‍රේණියේ අවම වශයෙන් වසර 02ක පළපුරුද්ද.

වැටුප් පරිමාණය :

AR 1 – 2016 රු. (53,150 – 10 x 1,375 – 15 x 1,910 – 95,550)

කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව චක්‍රලේඛ අංක 02/2016 පරිදි ජීවන වියදම් දීමනාව සහ රජයේ අනුමත අනෙකුත් දීමනා ද ගෙවනු ලැබේ. ඊට අමතරව මාසික වෘත්තීය හා දුරකථන දීමනාව ගෙවනු ලැබේ.

පුහුණු හැකියාවන් මත පදනම්ව අතිරේක අදායම් අවස්ථා ලබා දෙනු ඇත.

වාර්ෂිකව තරු හතරේ/ පහේ හොටල්වල නේවාසික පුහුණුව ලැබීමේ අවස්ථා ලබා දෙනු ඇත.

වයස :

වයස අවුරුදු 22 ට නොඅඩු විය යුතු අතර, අවුරුදු 45ට නොවැඩි විය යුතුය. උපරිම වයස් සීමාව අභ්‍යන්තර අයදුම්කරුවන්ට අදාළ නොවේ.

04. සහකාර අධ්‍යක්ෂ - මුදල් (MM 1-2 කාණ්ඩය) - කොළඹ

සුදුසුකම් (පහත 1 හෝ 2 හෝ 3) :

1. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව පිළිගත් මුදල්/ ගණකාධිකරණය/ වාණිජ්‍ය/ මුදල් කළමනාකරණය/ ව්‍යාපාර පරිපාලනය පිළිබඳ උපාධියක්

   -සහ-

   පළමු උපාධිය ලබාගැනීමෙන් පසු ගණකාධිකරණය පිළිබඳ අවම වශයෙන් වසරක පශ්චාත් සුදුසුකම් පළපුරුද්ද

2. පිළිගත් වෘත්තීය වරලත් ආයතනයක (ICASL/ CIMA/ ACCA) අන්තර්මාධ්‍ය පරීක්ෂණය සමත්වීම හෝ අදාළ වෘත්තීය ආයතනයක වෙනත් ඕනෑම සමාන සුදුසුකම් සහ රාජ්‍ය සේවයේ/ සංස්ථා, ව්‍යවස්ථාපිත මණ්ඩලයක/ ආයතනයක හෝ පිළිගත් පෞද්ගලික ආයතනයක අවම වශයෙන් වසරක පශ්චාත් සුදුසුකම් පළපුරුද්ද.
3. ගණකාධිකරණය පිළිබඳ උසස් ජාතික ඩිප්ලෝම සහතිකයක් (HNDA) ලබා තිබීම.

   -සහ-

   රාජ්‍ය සේවයේ, සංස්ථා, ව්‍යවස්ථාපිත මණ්ඩලයක/ ආයතනයක හෝ අදාළ ක්ෂේත්‍රයේ පිළිගත් පෞද්ගලික ආයතනයක, අවම වශයෙන් වසරක පශ්චාත් සුදුසුකම් පළපුරුද්ද.

වැටුප් පරිමාණය :

MM 1-2 – 2016 රු. (54,550 – 10 x 1,375 – 15 x 1, 910 – 96, 550)

කළමනාකරණ සේවා දෙපාර්තමේන්තු චක්‍රලේඛ අංක 02/2016 පරිදි ජීවන වියදම් දීමනාව සහ රජයේ අනුමත අනෙකුත් දීමනා ද ගෙවනු ලැබේ. ඊට අමතරව මාසික වෘත්තීය දීමනාවක් දුරකථන හා ප්‍රවාහන දීමනා ගෙවනු ලැබේ.

වයස :

වයස අවුරුදු 22ට නොඅඩු විය යුතු අතර, අවුරුදු 45ට නොවැඩි විය යුතුය. උපරිම වයස් සීමාව අභ්‍යන්තර අයදුම්කරුවන්ට අදාළ නොවේ.

5. සහකාර අධ්‍යක්ෂ - තොරතුරු තාක්ෂණය (MM 1-2 කාණ්ඩය) - කොළඹ

සුදුසුකම් :

1. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව පිළිගත් තොරතුරු තාක්ෂණය පිළිබඳ උපාධියක්

   - සහ -

   රාජ්‍ය සේවයේ, සංස්ථාවක, ව්‍යවස්ථාපිත මණ්ඩලයක / ආයතනයක හෝ අදාළ ක්ෂේත්‍රයේ පිළිගත් පෞද්ගලික ආයතනයක, අවම වශයෙන් වසරක පශ්චාත් සුදුසුකම් පළපුරුද්ද.

වැටුප් පරිමාණය :

MM 1-2 - 2016 රු. (54,550 - 10 x 1,375 - 15 x 1,910 - 96,550)

කළමනාකරණ සේවා දෙපාර්තමේන්තු චක්‍රලේඛ අංක 02/2016 පරිදි ජීවන වියදම් දීමනාව සහ රජයේ අනුමත අනෙකුත් දීමනා ද ගෙවනු ලැබේ. ඊට අමතරව මාසික වෘත්තීය දීමනාවක් දුරකථන හා ප්‍රවාහන දීමනා ගෙවනු ලැබේ.

වයස :

වයස අවුරුදු 22 ට නොඅඩු විය යුතු අතර, අවුරුදු 45ට නොවැඩි විය යුතුය. අභ්‍යන්තර අයදුම්කරුවන්ට උපරිම වයස් සීමාව අදාළ නොවේ.

06. පරිපාලන නිලධාරී (JM 1-2 කාණ්ඩය) - කොළඹ

සුදුසුකම් :

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව පිළිගත් මානව සම්පත් කළමනාකරණ/ පරිපාලනය පිළිබඳ උපාධියක්

වැටුප් පරිමාණය :

JM 1-2 – 2016 රු. (43,555 – 10 x 755 – 18 x 1,135 -71, 335)

කළමනාකරණ සේවා දෙපාර්තමේන්තු චක්‍රලේඛ අංක 02/2016 පරිදි ජීවන වියදම් දීමනාව සහ රජයේ අනුමත අනෙකුත් දීමනා ද ගෙවනු ලැබේ.

වයස :

වයස අවුරුදු 22 ට නොඅඩු විය යුතු අතර, අවුරුදු 45ට නොවැඩි විය යුතුය. උපරිම වයස් සීමාව අභ්‍යන්තර අයදුම් කරුවන්ට අදාළ නොවේ.

07. වැඩසටහන් නිලධාරී - (විභාග) (JM 1-2 කාණ්ඩය) - කොළඹ

සුදුසුකම් :

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව පිළිගත් පරිපාලනය, කළමනාකරණ, අධ්‍යාපන, සංචාරක ව්‍යාපාරය හෝ ඒවාට සම්බන්ධිත සමාජ විද්‍යාව පිළිබඳ උපාධියක්

වැටුප් පරිමාණය :

JM 1-2 2016 රු. (43,355 – 10 x 755 – 18 x 1,135 – 71,335)

කළමනාකරණ සේවා දෙපාර්තමේන්තු චක්‍රලේඛ අංක 02/2016 පරිදි ජීවන වියදම් දීමනාව සහ රජයේ අනුමත අනෙකුත් දීමනා ද ගෙවනු ලැබේ.

වයස :

වයස අවුරුදු 22 ට නොඅඩු විය යුතු අතර, අවුරුදු 45ට නොවැඩි විය යුතුය. උපරිම වයස් සීමාව අභ්‍යන්තර අයදුම් කරුවන්ට අදාළ නොවේ.

08. කළමනාකරණ සහකාර (තාක්ෂණ නොවන) (MA 1-2 කාණ්ඩය) - යාපනය

සුදුසුකම් :

සිංහල/දෙමළ, ඉංග්‍රීසි භාෂාව, ගණිතය යන විෂයයන්ට සම්මාන සාමාර්ථ සහිතව අ.පො.ස. (සා/පෙළ) විභාගයට එකම වාරයකදී විෂයයන් හයකින් සමත්වීම.

සහ

අ.පො.ස.(උ/පෙළ) විභාගය විෂයයන් තුනකින් (සාමාන්‍ය පොදු පරීක්ෂණය හැර) සමත්වීම.

වැටුප් පරිමාණය :

MA 1-2 – 2016 රු. (27,910 – 10 x 300 – 7 x 350 – 12 x 600 – 12 x 710 – 49,080)

කළමනාකරණ සේවා දෙපාර්තමේන්තු චක්‍රලේඛ අංක 02/2016 පරිදි ජීවන වියදම් දීමනාව සහ රජයේ අනුමත අනෙකුත් දීමනා ද ගෙවනු ලැබේ.

වයස :

වයස අවුරුදු 18 ට නොඅඩු විය යුතු අතර, අවුරුදු 45ට නොවැඩි විය යුතුය. උපරිම වයස් සීමාව අභ්‍යන්තර අයදුම් කරුවන්ට අදාළ නොවේ.

09. ගබඩා සහකාර (PL 2 කාණ්ඩය) - කොළඹ

සුදුසුකම් :

වෘත්තීය අභ්‍යාස අධ්‍යාපන කොමිෂන් සභාව මගින් පිළිගත් තාක්ෂණ වෘත්තීය අභ්‍යාස ආයතනයකින් නිකුත් කළ ගබඩා කළමනාකරණ පිළිබඳ ජාතික වෘත්තීය සුදුසුකම් (NVQ) මට්ටම 2 ට අඩු නොවූ ප්‍රවීනතා සහතිකය ලබා තිබීම.

වැටුප් පරිමාණය :

PL 2 – රු. (25,750 – 10 x 270 – 10x 300 – 10 x 330 – 12 x 350 – 38,950)

කළමනාකරණ සේවා දෙපාර්තමේන්තු චක්‍රලේඛ අංක 02/2016 පරිදි ජීවන වියදම් දීමනාව සහ රජයේ අනුමත අනෙකුත් දීමනා ද ගෙවනු ලැබේ.

වයස :

වයස අවුරුදු 18 ට නොඅඩු විය යුතු අතර, අවුරුදු 45ට නොවැඩි විය යුතුය. උපරිම වයස් සීමාව අභ්‍යන්තර අයදුම් කරුවන්ට අදාළ නොවේ.

පොදු තොරතුරු :

01. සේවක අර්ථසාධක අරමුදලට හා සේවක භාරකාර අරමුදලට (EPF හා ETF) දායකත්වය
    - අ.) සේ. අ. අරමුදලට සේවකයා විසින් ඒකාබද්ධ වැටුපෙන් 10% බැගින්ද, සේව්‍යයා විසින් 15% කින්ද දායක වනු ඇත.
    - ආ.) සේ.භා.අරමුදලට සේව්‍යයා විසින් වැටුපෙන් 3% කින් දායක වනු ඇත.
02. සේවකයා හා ඔහුගේ / ඇයගේ පවුල සඳහා ආකර්ෂණීය වෛද්‍ය රක්ෂණ ආවරණයක්.
03. සුදුසුකම් සපුරන්නන් සඳහා ප්‍රවාහන දීමනාවක් ගෙවනු ලැබේ.
04. පැයක් ඇතුළත අදාළ පාසල/ සේවා ස්ථානය වෙත දෛනිකව ළඟා විය හැකි අයදුම්කරුවන්ට ප්‍රමුඛතාවය ගිම්වේ.

සෑම අයදුම්කරුවකුම,

අ. ශ්‍රී ලාංකික පුරවැසියකු විය යුතුය.

ආ. තනතුරේ රාජකාරි මැනවින් ඉටුකිරීම සඳහා කායිකව හා මානසිකව යෝග්‍ය විය යුතුය.

ඇ. ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට කැමති විය යුතුය.

ඈ. විශිෂ්ඨ චරිතයකින් හෙබි විය යුතුය.

සම්පූර්ණ ජීව දත්ත විස්තර සහිත අයදුම්පත්, අධ්‍යාපනික සුදුසුකම්, වැඩ පළපුරුද්ද ආදියට අදාළ සියලුම සහතික වල පිටපත් සහ ඥාතීන් නොවන නිර්දේශකයින් දෙදෙනෙකුගේ නම්ද සහිතව ලිපි කවරයේ වම් ඉහළ කෙළවරේ අයදුම්කරන තනතුර සඳහන් කොට 2023 – 07 – 09 වන දින හෝ ඊට පෙර පහත අත්සන් කරන අය වෙත ලියාපදිංචි තැපැලෙන් ලැබීමට සැලැස්විය යුතුය. අංක 2 සහ 3 යටතේ ඇති තනතුරු සඳහා පමණක් ඔබ සේවය කිරීමට කැමති සේවා ස්ථාන ප්‍රමුඛතා පිළිවෙලට සඳහන් කරන්න.

අධ්‍යක්ෂ ජනරාල්,
ශ්‍රී ලංකා සංචාරක හා හෝටල් කළමනාකරණ ආයතනය
නො. 78, ගාලු පාර, කොළඹ 03.

සාමාන්‍ය විමසීම් : 011 - 2208300 දිගුව 303/372
වැඩි විස්තර සඳහා : www.slithm.edu.lk